(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 2(19).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 ජනවාරි 19 සිකුරාදා**

**2024 පෙබරවාරි 06 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1317/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන කාති උසාවි සංඛ්‍යාව කොපමණද;

(ii) කාති උසාවි මඟින් ලබා දෙන ලද තීන්දු අනුව වර්ෂ 2015 සිට මේ දක්වා සිදු වී ඇති දික්කසාද සංඛ්‍යාව කොපමණද;

(iii) කාති උසාවිවල සේවය කරන වයස අවුරුදු 60 ඉක්මවූ කාතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) උපාධි සුදුසුකම් සහිත කාතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) කාතිවරුන් තෝරාගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1467/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයේ ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල් අතරින් මධ්‍යම රජයට හා පළාත් සභාවලට අයත් ආයුර්වේද රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉදිරියේදී ඉදිකිරීමට සැලසුම් කර ඇති ඇති නව ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා ඉදිකරනු ලබන ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1515/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති සිනමා ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට චිත්‍රපටි ප්‍රදර්ශනය කරනු ලබන සිනමා ශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2019 සිට මේ දක්වා ජාතික චිත්‍රපටි සංස්ථාව විසින් ප්‍රදර්ශනය කර ඇති චිත්‍රපටි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2019 සිට මේ දක්වා චිත්‍රපටි නිෂ්පාදනය කිරීම සඳහා ලබා දී ඇති ණය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1554/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඖෂධ පැළෑටි වර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාව ඖෂධ පැළෑටි අපනයනය කරන්නේද;

(iii) එසේ නම්, එම ඖෂධ පැළෑටි වර්ග කවරේද;

(iv) ඒවා අපනයනය කිරීමෙන් වාර්ෂිකව උපයනු ලබන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1585/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කුරුඳු වගා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන බහුලව සිදු කරනු ලබන ප්‍රදේශ කවරේද;

(iii) කුරුඳු වගාව සඳහා පැළ සහ පොහොර ලබා දෙන පදනම කවරේද;

(iv) 2019 වර්ෂයෙන් පසු කුරුඳු වගා කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1626/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990 ඔක්තෝබර් 15 දින ශ්‍රී ලංකා රජය එළැඹි රැම්සා සම්මුතියට අනුව මුතුරාජවෙල තෙත්බිම් කලාපය ආරක්ෂා කරගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) මධ්‍යම පරිසර අධිකාරිය සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මුතුරාජවෙල තෙත්බිම් කලාපයේ ශාක හා සත්ත්ව ප්‍රජාව සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් නඩත්තු කර තිබේද;

(iii) මුතුරාජවෙල තෙත්බිම් කලාපයට අයත් ඉඩම්, අනවසරයෙන් ගොඩ කිරීම සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි පිළිබඳව ගෙන ඇති විධිමත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1648/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අතරින් ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා මේ වනවිට භාවිතා කරනු ලබන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් පෞද්ගලික අංශයට බදු පදනම මත ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම සමාගම්/ආයතන කවරේද;

(v) ඉඩම් බදු දීම මඟින් අධිකාරිය උපයන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2402/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වකුගඩු රෝගීන් සිටින පවුල්වල නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මූල්‍යමය ආධාරයක් ලබා දෙන්නේද;

(ii) එම මූල්‍යමය ආධාරය කොපමණද;

(iii) එම ආධාරය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් කවරේද;

(iv) ඒ සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මූල්‍යමය ආධාරය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ මේ වනවිට එම අධාරය ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සුදුසුකම් සපුරා ඇති සියලුම ඉල්ලුම්කරුවන්ට එම ආධාරය ලබා දෙන්නේද;

(iii) එසේ නම් එම දිනය කවරේද;

(iv) එයින් නිවසක් නොමැති වකුගඩු රෝගීන් සිටින පවුල් සඳහා නිවසක් ඉදිකර දීමේ වැඩසටහනක් ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2697/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා මාතලේ දිස්ත්‍රික්කයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි මුළු සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිසුන් සංඛ්‍යාව විද්‍යා, ගණිත, වාණිජ සහ කලා විෂය ධාරාව අනුව ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාතලේ දිස්ත්‍රික්කයේ සිසුන්ගෙන් බහුතරයක් අ.පො.ස. (උ. පෙ.) විද්‍යා හෝ ගණිත විෂය ධාරව වෙත යොමු කරවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2883/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂයේ අතුරු අයවැයෙන් පශු සම්පත් සංවර්ධනය සඳහා වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදනය කොපමණද;

(ii) එයින් භාවිතා කරන ලද සහ භාවිතා නොකරන ලද ප්‍රතිපාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ කුකුළු මස් නිෂ්පාදනය සහ කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
**(2024 පෙබරවාරි 06 අඟහරුවාදා)**

3741/2023

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛනයට අනුව අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලවල ලේකම්වරුන්ට සහ අමාත්‍යාංශයක ස්ථිර ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්වරුන්ට විශ්‍රාම වැටුප් හිමි බව දන්නේද;

(ii) මේ වනවිට එම විශ්‍රාම වැටුප් ලබාගන්නා සහ ඒ සඳහා ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් ලේකම්වරුන්ට වැන්දඹු/අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම සහ විශ්‍රාම පාරිතෝෂික හිමිකම ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාර්ගගත ක්‍රමයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත අදාළ ලේඛන යොමු කිරීම සම්බන්ධයෙන් රජයේ ආයතනවල විෂය ලිපිකරුවන්ට පුහුණුවක් ලබා දෙන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ සෘජු දුරකථන අංකයක් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අමාත්‍ය පෞද්ගලික කාර්ය මණ්ඩලයක ලේකම්වරයෙකු සහ වැවිලි රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකු ලෙස කටයුතු කළ වමල් එස්. පියසුන්දර මහතාගේ විශ්‍රාම වැටුප මේ දක්වා ගෙවා නොමැති බව දන්නේද;

(ii) එයට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 පෙබරවාරි 07 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1686/2023

ගරු වාල්ස් නිර්මලනාදන් මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ, වෙංගල චෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොවීන්ගේ වගාවලට වනඅලින් හා වඳුරන් වැනි සතුන් විසින් අඛණ්ඩව හානි සිදු කරනු ලබන බවත්,

(ii) වනජීවී දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් ස්ථිර පියවරක් නොගැනීම හේතුවෙන් එම ගොවීන් කෘෂිකාර්මික කටයුතුවලින් ඉවත්වීමේ තත්ත්වයක් උද්ගත වී ඇති බවත්,

(iii) මේ සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත 2020.10.20 දිනැතිව මා විසින් කරන ලද ලිඛිත ඉල්ලීමට මේ වනතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) වෙංගල චෙට්ටිකුලම ප්‍රදේශයේ ගම්මාන 17 ක් ආවරණය වන පරිදි අලි වැටක් ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉල්ලා සිටින ලද රු.මිලියන 368.2 ක මුදල ලබා නොදීමට හේතු කවරේද;

(ii) ඉහත වගාබිම් වනඅලින් හා වඳුරන් වැනි සතුන්ගෙන් ආරක්ෂා කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1767/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී ඇතුළු අනෙකුත් බෝගවල අස්වනු නෙලීම සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීම මේ වනවිට ඉහළ ගොස් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, අස්වනු නෙලීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍ර සූත්‍ර සම්බන්ධයෙන් නියාමනයක් සිදු කරන්නේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී ඒ සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෘෂි යන්ත්‍ර සූත්‍ර සඳහා අය කරනු ලබන ගාස්තු ඉහළ ගොස් ඇති බැවින් ගොවීන් දැඩි දුෂ්කරතාවයට පත් වී ඇති බව පිළිගන්නේද;

(ii) යන්ත්‍ර සූත්‍ර සඳහා ඉඩම් අක්කරයකට/වී බුසලකට අය කළ හැකි උපරිම ගාස්තුවක් නියම කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, උපරිම ගාස්තුවක් නියම කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1817/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ රිය අනතුරුවලින් මරණයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකාවේ රිය අනතුරු සංඛ්‍යාව ඉහළ ගොස් තිබේ නම්, ඒ සඳහා බලපාන ලද හේතු සාධක කවරේද;

(iii) රිය අනතුරු අවම කිරීම සඳහා මේ වනතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2538/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iii) ඉහත එක් එක් ගබඩාවේ ගබඩා කළ හැකි වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2015 සිට මේ දක්වා ඉහත ගබඩාවල ගබඩා කරන ලද වී ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් වී ගබඩා අතරින් මේ වනවිට භාවිතයට නොගන්නා වී ගබඩා තිබේද;

(ii) එසේ නම්, එම වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iv) භාවිතයට නොගන්නා වී ගබඩා නැවත භාවිතයට ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති වී ගබඩාවලින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3240/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධිලාභීන්ට සහ අඩු ආදායම්ලාභීන්ට බෙදා දීම සඳහා 2022 වර්ෂයේ මහ කන්නයේදී මොනරාගල දිස්ත්‍රික්කයේ, රජය විසින් මිලදී ගන්නා ලද වී ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා මොනරාගල දිස්ත්‍රික්කයට ලබා දෙන ලද මුදල කොපමණද;

(iii) එම මුදලින් වී මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිලදී ගන්නා ලද ඉහත වී සහල් බවට පත් කිරීමේදී, වී මෝල් හිමියන් විසින් එම කාර්යය සාර්ථකව ඉටුකිරීමට සමත් වී තිබේද;

(ii) එම සහල් ප්‍රතිලාභීන් වෙත බෙදා දීමේදී අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එම කාර්යය නිවැරදිව ඉටුකර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 පෙබරවාරි 08 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2583/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා හම්බන්තොට ලුණු ලේවායේ නිෂ්පාදනය කරන ලද ලුණු ප්‍රමාණය සහ එමඟින් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාල සීමාවේදී මඩලුණු නිෂ්පාදනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉදිරියේදී මඩලුණු නිෂ්පාදනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2623/2023

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2852/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කර ඇති වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැටලීම් සංඛ්‍යාවෙන් මේ වනවිට නීතිමය පියවර ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත වැටලීම් සංඛ්‍යාවෙන් සමථයකට පත් කරගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) පාරිභෝගිකයන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම උදෙසා අධිකාරියේ මෙහෙයුම් අඛණ්ඩව සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එකම භාණ්ඩය විවිධ මිල ගණන් යටතේ අලෙවි කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2977/2023

ගරු හේෂා විතානගේ මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව පුරා සාමදාන විනිශ්චයකරුවන් විශාල පිරිසක් සිටින අතර ඔවුන් ජනතාවට විශාල සේවයක් කරන බවත්;

(ii) සිය තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා සමහර සාමදාන විනිශ්චයකරුවන්ට ප්‍රමාණවත් පුහුණුවක් නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එක් බල ප්‍රදේශයකට හා මුළු දිවයිනටම බලපැවැත්වෙන පරිදි පත් කර ඇති සාමදාන විනිශ්චයකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂයකට පත් කරනු ලබන නව සාමදාන විනිශ්චයකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) සාමදාන විනිශ්චයකාර තනතුර සඳහා අයදුම්කරුවන් විසින් අනිවාර්යයෙන් සපුරාලිය යුතු මූලික සුදුසුකම් කවරේද;

(iv) සාමදාන විනිශ්චයකරුවන් පත් කිරීමේදී, තනතුරට අදාළ සේවාව සම්බන්ධයෙන් ඔවුන්ට විධිමත් පුහුණුවක් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3082/2023

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක වැටුප් විෂමතාවයක් පවතින බව පිළිගන්නේද;

(ii) එම විෂමතාවය සම්බන්ධයෙන් ජාතික වැටුප් කොමිෂන් සභාව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග සාකච්ඡා කර තිබේද;

(iii) එසේ නම්, එහිදී එළැඹි තීරණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කළමනාකාරීත්වය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3097/2023

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා සම්බන්ධයෙන් කර ඇති නිරීක්ෂණ හා නිර්දේශ කවරේද;

(ii) ඔහු පොලිස් පරිපාලන අංශ ප්‍රධානි තනතුරට පත් කරන ලද දිනය, එම තනතුර සඳහා ඔහු නිර්දේශ කරන ලද දිනය සහ එම තනතුරට ඔහු නිර්දේශ කරන ලද පුද්ගලයන්ගේ හා ආයතනවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති ඉහත නිලධාරියා එම තනතුරට පත් කිරීම සඳහා බලපෑ සාධක කවරේද;

(iv) ඉහත පත් කිරීම, නැවත සලකා බැලීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3112/2023

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, ඩෙල්ෆ්ට් දූපතේ ප්‍රධාන ප්‍රවාහන මාර්ගය මුහුදු මාර්ගය බවත්;

(ii) එම දූපතේ පිහිටා ඇති වරාය, ශ්‍රී ලංකා නාවික හමුදාවේ භාවිතයට යොදා ගනු ලබන බවත්;

(iii) මේ හේතුවෙන් සාමාන්‍ය ධීවරයන්ගේ බෝට්ටු නවතා තැබීමට නොහැකි වීමෙන් ඔවුන් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

(iv) එම දූපතේ ප්‍රවාහන කටයුතුවලට භාවිතා කරනු ලබන ''කුමුදිනී'' නැමැති බෝට්ටුව ඉතා අබලන් වී ඇති බවත්;

(v) ''වඩතාරගයි'' බෝට්ටුව අලුත්වැඩියා කටයුතුවලට රැගෙන ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඩෙල්ෆ්ට් දූපතේ තුළ පවතින මහාමාර්ග අමාත්‍යාංශයට අයත්වන මාර්ගවල දිග කොපමණද;

(ii) ඩෙල්ෆ්ට් වරායේ නවතා තැබිය හැකි බෝට්ටු සංඛ්‍යාව කොපමණද;

(iii) ඩෙල්ෆ්ට් දූපතේ ප්‍රවාහන කටයුතුවලට භාවිතා කරනු ලබන බෝට්ටු සංඛ්‍යාව කොපමණද;

(iv) ඩෙල්ෆ්ට් දූපත සඳහා මුහුදු ප්‍රවාහනය විධිමත් කිරීම සඳහා මේ වනතෙක් කටයුතු නොකිරීමට හේතු කවරේද;

(v) ඩෙල්ෆ්ට් දූපත සඳහා විධිමත් ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

3155/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා පොලීසියේ, පොලිස් පරීක්ෂක, පොලිස් සැරයන් සහ පොලිස් කොස්තාපල් යන එක් එක් තනතුරේ සේවය කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් තනතුරේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත තනතුරුවල සේවය කරනු ලබන නිලධාරීන්ට උසස්වීම් ලබාදීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) පොලිස් සැරයන් තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුරට උසස් වීම සඳහා ගත වන කාලය කොපමණද;

(v) ශ්‍රී ලංකා පොලීසියට ආධුනික පොලිස් කොස්තාපල්වරුන් බඳවාගැනීමේදී, මේ වනවිට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3179/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්ධන බෙදාහැරීම සඳහා ශ්‍රී ලංකාවේ ඉදිකර ඇති ඉන්ධන බෙදාහැරීමේ ප්‍රධාන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් මධ්‍යස්ථානයේ ගබඩා ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් මධ්‍යස්ථානයේ ගබඩා ධාරිතාවය අවසන්වරට වැඩි කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වර්තමාන ඉන්ධන ඉල්ලුමට සාපේක්ෂව ඉහත සඳහන් මධ්‍යස්ථානවල ගබඩා ධාරිතාව පහළ මට්ටමක පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒවයේ ගබඩා ධාරිතාවය වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) බවුසර් මඟින් ඉන්ධන ප්‍රවාහනය කිරීමට සාපේක්ෂව දුම්රිය ගැල් මඟින් ඉන්ධන ප්‍රවාහනය කිරීම ලාභදායක සහ ගැටලු අවම ක්‍රමයක් බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඉන්ධන ප්‍රවාහනය සඳහා වැඩි වශයෙන් දුම්රිය භාවිතා කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3412/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂය තුළ රිය අනතුරුවලට ලක් වී ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අනතුරු හේතුවෙන් මරණයට පත් වූ හා තුවාල ලැබූ මගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත අනතුරු සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් විමර්ශන සිදු කර තිබේද;

(iv) එසේ නම්, එම විමර්ශනවල නිගමන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2022 වර්ෂය තුළ රිය අනතුරුවලට ලක් වී ඇති පුද්ගලික බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අනතුරු හේතුවෙන් මරණයට පත් වූ හා තුවාල ලැබූ මගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අනතුරු අවම කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 පෙබරවාරි 09 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3368/2023

ගරු මයන්ත දිසානායක මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය දරන, අර්ධ-රාජ්‍ය සහ පෞද්ගලික අංශ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම අරමුදලේ ඇති මුදල කොපමණද;

(iii) එම මුදල් වෙනත් වැඩසටහන් සඳහා භාවිතා කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3401/2023

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවට බඳවාගන්නා ලද සේවකයන් ස්ථිර කිරීමේ කොන්දේසි ඊට අදාළ අමාත්‍ය මණ්ඩල අනුමතිය අනුව කවරේද;

(ii) එම කොන්දේසිවලට අනුව ස්ථිර කිරීමට නොහැකි සේවකයන් සිටින්නේද;

(iii) එසේ නම්, එම සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් සේවකයාගේ සේවා කාලය සහ ස්ථිර කිරීමට නොහැකි හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත දෙපාර්තමේන්තුවට බඳවා ගන්නා ලද, සුදුසුකම් සපුරා ඇති සේවකයන් ස්ථිර නොකිරීම හේතුවෙන් එම සේවකයන්ට බලවත් අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සේවකයන් ස්ථිර කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3426/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමහර වෛද්‍ය පරීක්ෂණ රජයේ රෝහල්වල සිදු නොකිරීම හේතුවෙන් ඒවා පෞද්ගලික රෝහල්/පෞද්ගලික වෛද්‍ය පරීක්ෂණ ආයතනවලින් සිදු කර ගැනීමට රෝගීන්ට සිදු වී ඇති බවත්;

(ii) එකම වෛද්‍ය පරීක්ෂණය සඳහා පෞද්ගලික රෝහල්/පෞද්ගලික වෛද්‍ය පරීක්ෂණ ආයතන විවිධ මිළ ගණන් අය කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එකම වෛද්‍ය පරීක්ෂණය සඳහා විවිධ මිල ගණන් අය කිරීම සම්බන්ධයෙන් නියාමනයක් සිදුකර පෞද්ගලික රෝහල්/පෞද්ගලික වෛද්‍ය පරීක්ෂණ ආයතන විසින් සිදුකරනු ලබන වෛද්‍ය පරීක්ෂණ සඳහා අවම මිලක් නියම කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3486/2023

ගරු වේලු කුමාර් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුනෙස්කෝ සංවිධානය විසින් මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බවත්;

(ii) ශ්‍රී ලංකාවට ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන රාශියක් එම නගරයේ පිහිටා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මහනුවර නගරයේ පිහිටි ලෝක උරුමයන් ලෙස හඳුනාගෙන ඇති පූජනීය ස්ථාන සහ ගොඩනැගිලි කවරේද;

(ii) ඒවා ආරක්ෂා කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානය විසින් මූල්‍යාධාර ලබා දෙන්නේද;

(iii) එසේ නම්, ලබා දෙනු ලබන වාර්ෂික මූල්‍යාධාරය කොපමණද;

(iv) මහනුවර නගරයේ පිහිටි ලෝක උරුමයන් ලෙස හඳුනාගෙන ඇති පෞද්ගලික ගොඩනැගිලි කවරේද;

(v) එම ගොඩනැගිලි හිමිකරුවන්ටද කිසියම් මූල්‍යාධාරයක් ලබා දෙන්නේද;

(vi) එසේ නම්, එම මූල්‍යාධාරය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ)(i)හි සඳහන් ස්ථාන ඒ අයුරින්ම පවත්වාගෙන යන්නේද;

(ii) ඒවායේ වෙනස්කම් සිදු කිරීමට අවසර ලබා දී තිබේද;

(iii) මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස පවත්වාගෙන යාම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3560/2023

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023.07.01 දින පොලිස් නිලධාරීන් සමඟ පැමිණි සෙවනගල සීනි කර්මාන්ත ශාලාවේ පාලන අධිකාරිය විසින් ඕංඩුම නිවාස සංකීර්ණයේ නිවාසවල ජලය හා විදුලිය විසන්ධි කර ඇති බවත්;

(ii) විශ්‍රාම ගන්වන අවස්ථාවේදී යැපෙන්නන් බඳවාගැනීමට හෝ පදිංචිය සඳහා ඉඩමක් ලබා දීමට, 1983-1986 කාලයේදී එම නිවාස සංකීර්ණයේ නිවාසවල සේවකයන්ව පදිංචි කරවන අවස්ථාවේදී පාලන අධිකාරිය විසින් පොරොන්දු වී ඇති බව ත්;

(iii) වර්ෂ 30-40ක් තිස්සේ එම නිවාසවල පදිංචි වී සිටිමින් ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් එම සේවකයන් ක්‍රියා කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පදිංචිව සිටින සේවකයන්ට අසාධාරණ ලෙස සලකමින් ආයතනයේ ඉඩම් කැබලි පදිංචි වීම සඳහා වෙනත් බාහිර පුද්ගලයන්ට ලබා දෙන බව දන්නේද;

(ii) ඉහත නිවාසවල පදිංචි වී සිටින සේවකයන්ට තවදුරටත් එම නිවාසවල රැඳී සිටීමට අවසර දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3646/2023

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය වැවිලි සංස්ථාව හා රාජ්‍ය ව්‍යවසායකත්වය යටතේ පැවති වතුවල කළමනාකරණය, බදු පදනම යටතේ පෞද්ගලික සමාගම් වෙත ලබා දුන් බව දන්නේද;

(ii) එසේ නම්, එම සමාගම් කවරේද;

(iii) එලෙස ලබා දෙන ලද වතු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගම්වල බදු කාලය කොපමණද;

(ii) එම බදු කාලය දීර්ඝ කිරීමට පියවර ගන්නේද;

(iii) එම සමාගම් විසින් ඉහත වතු අතුරු බදු දී තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, එම සමාගම්/ආයතන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අතුරු බදු දීමේදී කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි කටයුතු කර තිබේද;

(ii) කම්කරු නීති හා කම්කරු අයිතිවාසිකම් උල්ලංඝනය වන පරිදි නීත්‍යානුකූල නොවන ආකාරයට සිදු කරනු ලබන අතුරු බදු දීම් වැළැක්වීම සඳහා පියවර ගන්නේ ද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3663/2023

ගරු ලලිත් එල්ලාවල මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සූරියවැව, මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැයකර ඇති මුදල කොපමණද;

(ii) එම ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා විදේශ පරිත්‍යාග ලැබුණේද;

(iii) එසේ නම්, එම එක් එක් විදේශ පරිත්‍යාගයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, එම ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා අදාළ ආයතනය තෝරා ගන්නා ලද ක්‍රමවේදය කවරේද;

(iii) ඉදිකිරීම් විදේශ ආයතනයක් විසින් සිදුකරන ලද්දේ නම්, එහි ශ්‍රී ලාංකික නියෝජිතායතනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැය කර ඇති රජයේ අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම අරමුදල් ලබා ගන්නා ලද ආයතන කවරේද;

(iii) එම ක්‍රීඩාංගණය විවෘත කරන ලද දිනයේ සිට මේ දක්වා එහි ආදායම සහ වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3673/2023

ගරු හර්ෂණ රාජකරුණා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඩෙංගු මර්දන වැඩසටහනෙහි සේවය කරන ලද අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ තාවකාලික සේවකයන් 2019 වර්ෂයෙන් පසුව ඉවත් කර තිබේද;

(ii) එසේ ඉවත් කර ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් සේවකයාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඔවුන් ඉවත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉවත් කරන ලද එම සේවකයන් නැවත සේවයට කැඳවන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම සේවකයන් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3708/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(ii) ඒවා අතරින් දේශපාලනඥයන්ට සහ රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව ඇති පැමිණිලි සංඛ්‍යාව;

(iii) ඉහත (i)හි සඳහන් පැමිණිලි අතරින් අධිකරණට යොමු කළ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(iv) මූලික විමර්ශනයෙන් පසුව හෝ අධිකරණ විභාගය අතරතුරදී කොමිෂන් සභාව විසින් ඉල්ලා අස්කර ගත් පැමිණිලි/නඩු සංඛ්‍යාව;

(v) එම එක් එක් පැමිණිල්ලට/නඩුවට අදාළ විත්තිකරුවන්ගේ නම්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා අධිකරණයට යොමු කළ පැමිණිලි අතරින් අධිකරණ විසින් දණ්ඩනයක් නියම කරන ලද සහ අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලද පැමිණිලි/නඩු සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(ii) ප්‍රතික්ෂේප කළ එක් එක් පැමිණිල්ලට/නඩුවට අදාළ විත්තිකරුවන්ගේ නම්;

(iii) වැරදිකරුවන් කරන ලද පුද්ගලයන්ගෙන් අයකර ගත් දඩ මුදල එක් එක් වර්ෂය අනුව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3758/2023

ගරු විමලවීර දිසානායක මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2018 සිට 2022 දක්වා විශ්‍රාමික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වැය කරන ලද මුදල;

(ii) වර්ෂ 2010 සිට 2022 දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දෙන ලද තීරු බදු සහන වාහන බලපත්‍රවලට අදාළ තීරු බදු සහනයේ මූල්‍ය වටිනාකම;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 83/2024

ගරු බුද්ධික පතිරණ මහතා
ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
ගරු වඩිවේල් සුරේෂ් මහතා
ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ඇතුළු ජල මූලාශ්‍ර මඟින් පැන නැගී ඇති ගැටලු පිළිබඳව ගැඹුරින් විමර්ශනය කර නව ප්‍රතිනිර්මාණ යෝජනාවලියක් සැකසීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— මාතර දිස්ත්‍රික්කයේ ගොන්ගල හා රක්වාන කඳු පන්තිය ආශ්‍රිතව පැන නගින නිල්වලා ගඟ හා ගිං ගඟ පිළිවෙළින් මාතර හා ගාල්ල දිස්ත්‍රික්ක හරහා ගලා ගොස් මුහුදට එකතු වන අතර පොල්වත්ත ගඟ ද එවැනිම වැදගත් ජල මූලාශ්‍රයක් වන හෙයින්ද;

ලන්දේසි පාලන යුගයේ මෙම ගංගාවන්හි ජල කළමනාකරණය හා ගංවතුර කළමනාකරණය කෙරෙහි මුලින්ම අවධානය යොමු වී ඇති අතර නිදහස් ශ්‍රී ලංකාවේ ගිං හා නිල්වලා ගංගාවන්හි ජලය ගිනිකොනදිග ලංකාව හෙවත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පෝෂණය සඳහා යොදා ගැනීම පිළිබඳව මුල් යෝජනාව එවකට අකුරැස්ස පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වූ දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ මහතා විසින් 1950 දශකයේදී ඉදිරිපත් කර ඇති හෙයින් ද;

ගිං හා නිල්වලා ගංගා ආශ්‍රිත ජලය කළමනාකරණය කරමින් වාර්ෂිකව ඇතිවන ගංවතුර කළමනාකරණය කර එම ජලය දිස්ත්‍රික්ක දෙකෙහි ජනතාවගේ මානව ක්‍රියාකාරකම්, කෘෂිකාර්මික හා කර්මාන්ත ක්‍රියාවලිය, ජෛව විවිධත්වය හා පරිසර තුලාතාවය පවත්වා ගෙන යාම උදෙසා විධිමත්ව යොදා ගැනීම පිළිබඳව ඉන්පසු විවිධ විශේෂඥයින් විසින් වාර්තා ඉදිරිපත් කර ඇති හෙයින් ද;

1977 න් පසු නිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වුවද එය 1987–1989 වකවානුවේ රටේ පැවැති වාතාවරණය හේතුවෙන් අතරමඟ නතර කෙරුණු අතර, ඒ හේතුවෙන් නිල්වලා ගඟ ආශ්‍රිතව ගොවිබිම්, පුරන්බිම් බවට පත්වූ අතර, ගංවතුර තර්ජනය නොවෙනස්ව ක්‍රියාත්මක වෙමින් පවතින බැවින් නියං සමයේ කරදිය නිල්වලා ගඟ ඔස්සේ ඉහළට ගමන් කරමින් පානීය ජලයට මෙන්ම ගොවිබිම්වලට ද කරදිය මුසුවීම හේතුවෙන් බරපතල ගැටලු ඇති වූ අතර, ඒ වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද නිල්වලා ලවණ බාධකය හේතුවෙන් මේ වනවිට ගංවතුර අඛණ්ඩව ගොවිබිම් තුළ රැඳීම තුළින් වී, කුරුඳු, එළවළු, පොල් හා වෙනත් බෝග වගාවන්ට මෙන්ම කිරි ගොවීන් ද දුෂ්කරතා රැසකට මුහුණපාන බේදනීය තත්ත්වයක් නිර්මාණය වී ඇති හෙයින් ද;

ගිං ගඟ ආශ්‍රිතව ලවණ බාධකය සාර්ථක වූ අතර, නිල්වලා ගඟ ආශ්‍රිත ලවණ බාධකය අසාර්ථක වීම පිළිබඳව ගැඹුරින් විශ්ලේෂණය කළ යුතු තත්ත්වයක් වර්ධනය වී ඇති හෙයින් ද;

(අ) නිදහස් ශ්‍රී ලංකාවේ දශක 7½ කට ආසන්න යුගය තුළ ගිං සහ නිල්වලා ගංගා පිළිබඳව විද්වත් හා විශේෂඥයින් කරන ලද අධ්‍යයනයන් පිළිබඳව ගැඹුරින් විශ්ලේෂණය කර එකී යෝජනාවන්හි ඇති සාධනීය ලක්ෂණ හඳුනාගැනීමට ද;

(ආ) නිල්වලා හා ගිං ගංඟාවන් හි ඉහළ ද්‍රෝණියේ අතිරික්ත ජලය ගිණිකොන දිග ලංකාවට ගෙනයාම පිළිබඳව විද්‍යාත්මක පදනමකින් මෙන්ම ජන ජීවිතයට අවම පීඩනයක් ඇති වන ආකාරයෙන් කටයුතු කිරීමේ ක්‍රමවේද සම්බන්ධයෙන් ප්‍රායෝගික වැඩපිළිවෙළක් නිර්මාණය කිරීම පිළිබඳව යෝජනා ලබා ගැනීමට ද;

(ඇ) ඉහත (ආ) හි සංවර්ධන යෝජනාව මෙයට පෙර ක්‍රියාත්මක කිරීමට අදාළව ගන්නා ලද ක්‍රියාමාර්ග/වියදම් කරන ලද දේශීය හා විදේශීය අරමුදල්වල ඵලදායිතාව පිළිබඳව ගැඹුරින් විමර්ශන සිදු කිරීමට ද;

(ඈ) නිල්වලා ලවණ බාධකය හේතුවෙන් පැන නැගී ඇති සියලුම ආකාරයේ පීඩාවන් ඉවත් කිරීමට ගතයුතු කඩිනම් කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන යෝජනා සකස් කර ක්‍රියාත්මක කිරීමට අදාළ නිර්දේශ ලබා දීමට ද;

(ඉ) දිස්ත්‍රික්කයේ ජල පාරිභෝගිකයන් මෙන්ම අනාගතයේ පුළුල් කළ හැකි ජල ව්‍යාපෘති සඳහා දිගිලිඔය ඇතුළු ප්‍රදේශ තුළ උචිත නව ජල පවිත්‍රකරණ මධ්‍යස්ථාන ගොඩනගා ගැනීම හඳුනාගැනීමට ද, දැනට ක්‍රියාත්මක ජල පොම්පාගාර පිළිබඳ විද්‍යානුකූල පදනමින් විශ්ලේෂණය කරමින් නව ක්‍රමෝපායන් යෝජනා කිරීමට ද;

(ඊ) නිල්වලා ගඟ ආශ්‍රිතව සිදුවන කිඹුල්-මිනිස් ගැටුම පිළිබඳව තිරසර විසඳුමක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට ද;

(උ) දකුණු පළාතේ කාර්මික, කෘෂිකාර්මික, ජල විදුලි උත්පාදනය, පශු සම්පත් ක්ෂේත්‍රය වෙනත් මානව ක්‍රියාකාරකම් මෙන්ම ජෛව විවිධත්වය ආරක්ෂා කර ගනිමින් නිල්වලා හා ගිං ගංගාවල ජලය මුහුදට ගලා යාමට ප්‍රථම උපරිම ක්ෂමතාවයකින් භාවිතා කිරීම සම්බන්ධයෙන් වූ අදාළ යෝජනා ලබා ගැනීමට ද;

(ඌ) හුදෙක් ගංවතුර වැළැක්වීමේ සංවර්ධන ව්‍යාපෘතියකින් ඔබ්බට ගොස් ගිං-නිල්වලා කඩිනම් බහු කාර්ය යෝජනා ක්‍රමයක් මඟින් ඇති වී ඇති ගැටලු සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට මෙන්ම, මෙකී ජල මූලාශ්‍රයන් ප්‍රවාහනය, මිරිදිය ධීවර කර්මාන්තය, සංචාරක ව්‍යාපාරය, සංස්කෘතික ප්‍රබෝධය උදෙසා භාවිතා කිරීමට අදාළ නව නිර්මාණශීලි ප්‍රවේශයන් හඳුනාගැනීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීමට ද;

(එ) ගිං, නිල්වලා සහ පොල්වත්ත යන ගංගා ආශ්‍රිතව එකී ගංගාවලට එකතුවන අතු ගංගා/ආර හා එවැනි ආකාරයේ ජල පෝෂකයන් ආශ්‍රිතව මෙන්ම මෙකී ගංගා ද්‍රෝණි නිම්නයන් තුළ සිදු කළ යුතු සංවර්ධන ක්‍රියාවලීන් හඳුනාගැනීම, එකී ගංගා දෙපස රක්ෂිත ඇති කිරීම, අපද්‍රව්‍ය එක් කිරීම වළක්වා ගැනීම, මානව ක්‍රියාකාරකම් තුළින් ගංගා ජලය දූෂණය කරන්නා වූ ක්‍රමවේද පිටු දැකීම, අනවසර ඉදිකිරීම් මඟින් ජල මූලාශ්‍ර අවහිර කිරීම මෙන්ම ඇතැම් ජල විදුලි බලාගාර හරහා ගංගාවන්ට හා ජෛව විවිධත්වයට සිදු කරන හානි හඳුනාගෙන එකී තත්ත්වයන් පිටු දැකීමට අදාළ යෝජනා ඉදිරිපත් කිරීමට ද;

(ඒ) අතරමග නතර කරන ලද ඉහත ගංගාවලට අදාළ සංවර්ධන ව්‍යාපෘති තුළ ඉටු කළ යුතු අසම්පූර්ණ වැඩ කොටස් හඳුනා ගෙන එකී වැඩ කොටස් ක්‍රියාත්මක කිරීමට අදාළ යෝජනා සැකසීම, අවශ්‍ය අවස්ථාවන්හිදී මෙකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සිදු කරන ලද වියදම් පිළිබඳ ව්‍යවහාරික විගණනයන් ඇතුළු සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කිරීමට ද; සහ

(ඔ) ඉහත (එ) හි සඳහන් ගංගාවන්ට අදාළ වෙනත් කවර හෝ ඉටු කළ යුතු සංවර්ධන ක්‍රියාදාමයන් අතරමඟ නතර වූ ක්‍රියාදාමයන්, අසාර්ථක වූ ක්‍රියාදාමයන් පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කර කෙටි කාලීනව, මධ්‍ය කාලීනව හා දිගු කාලීනව ක්‍රියාත්මක කිරීමට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් පත්කළ යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101හි විධිවිධානයන්හි කුමක් සඳහන්ව තිබුණද කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් විසි දෙනෙකුගෙන් (20)සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු පූර්ණ වශයෙන් සලකා බැලීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතු ය.

4. සිය පළමු රැස්වීම් දිනයේ සිට මාස තුනක (03) කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් ලබාදෙන එවැනි අමතර කාලසීමාවක් තුළ හෝ කාරක සභාව විසින් සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.